ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 4 මට්ටම
අවසාන පරීක්ෂණය- 2023/2024
**LLU 4608** අපරාධ නීතිය
කාලය - පැය 3

---

දිනය -: **2024 මැයි 18** වේලාව -: ප.ව. **1.30** – ප.ව **04.30**

මුළු ප්‍රශ්න ගණන අටයි - 08
ප්‍රශ්න <u>පහකට (05) පමණක්</u> පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. "ප්‍රජාතන්ත්‍රික රාජ්‍යයක ආරක්ෂාව, සාමය සහ යුක්තිය පවත්වාගෙන යාම සඳහා අපරාධ යුක්තිය පසිඳිලීම සඳහා ශක්තිමත් නෛතික රාමුවක පැවැත්ම අත්‍යවශ්‍ය වේ."

   ඔබ ඉහත ප්‍රකාශය සමග එකඟ වන්නේ ද?

   ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති පද්ධතිය තුළ ඇති ප්‍රධාන ආයතන, ඒවායේ කාර්යභාරය හා වගකීම් විවේචනාත්මකව අගයන්න.

   ඔබගේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නිදසුන් මඟින් තහවුරු කරන්න.

(ලකුණු 20)

2.හයවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩේවිඩ් සිය මව වන රෝසි සමග පොත් ප්‍රදර්ශනයකට සහභාගී වීම සඳහා ගාල්ලෙන් පෙරවරු 9.30 ට පිටත් වන දුම්රියට ගොඩ වූයේය.දුම්රිය තුළ දෙදෙනාටම එක ළඟ අසුනක් හිමි නොවූ බැවින් තරමක් දුරින් පිහිටි අසුන් දෙකක ඔවුන්ට වාඩිවීමට සිදුවිය.ටික වේලාවකට පසුව රෝසි සිටි අසුන දෙසින් උදව් ඉල්ලා කෑ ගසන ශබ්දයක් ඩේවිඩ්ට ඇසුණි.ඩේවිඩ් එදෙසට දිවගිය පසු එහි සිටි පුද්ගලයෙකු විසින් රෝසිගේ ගෙලට පිහියක් දිගු කරමින් ඇයගේ රන්මාලය ගලවා ගැනීමට උත්සාහ දරමින් සිටින බව ඔහු දුටුවේය.රෝසි ඇයගේ අත තිබූ බෑගයෙන් ඔහුට පහර දුන් අතර ඔහු ලිස්සා ඇද වැටී ඔහුගේ හිස තුවාල විය.නමුත් ඔහු නැවතත් නැගිට පිහිය රැගෙන රෝසි වෙත දිව ආවේය. බියට පත්වූ ඩේවිඩ් එහි තිබූ යකඩ මුගුරක් ගෙන ඔහුගේ හිසට පහරක් එල්ල කළේය. සිද්ධියෙන් පසු ඩේවිඩ්ට ද බරපතල තුවාල සිදුවූ අතර ඔහු සිහි විසඥ විය.ඔහුව රෝහලට රැගෙන යාමෙන් පසු ඔහුට හදිසි ශල්‍යකර්මයක් කළ යුතු බවට වෛද්‍යවරයා විසින් නිර්දේශ කළේය.රෝසිගේ අවසරය නොමැතිව වෛද්‍යවරයා විසින් ඩේවිඩ්ට ශල්‍යකර්මය සිදු කළ අතර ඔහුගේ එක් පාදයක් ඉවත් කළේය. පැය කිහිපයකට පසුව රන්මාලය සොරකම් කිරීමට උත්සාහ දැරූ පුද්ගලයා මරණයට පත්විය.

ඉහත සිද්ධිමය කරුණු ඇසුරෙන් ඩේවිඩ්ට, රෝසිට සහ වෛද්‍යවරයාට අදාළ වන සාමාන්‍ය ව්‍යතිරේක පිළිබඳව සාකච්ඡා කරන්න.

ඔබගේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීරණ මඟින් පහදන්න.

(ලකුණු 20)

3."සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය හා මිනීමැරීම යන අපරාධයන් අතර පවත්නා ගුණාත්මක වෙනස අපරාධ ද්විත්වයෙහිම සාපරාධී මානසික ධාතුව තුළ රැඳී පවතී. ඒ අනුව අපරාධයන් ද්විත්වයෙහිම චේතනාව හා දැනුමෙහි විවිධ මූලිකාංග වල අනුක්‍රමික වෙනස්වීම සහ චූදිතයාගේ ක්‍රියාව තුළින් මරණය සිදුවීමට ඇති සම්භාවිතාව අපරාධයන් ද්විත්වය අතර පවතින හරයාත්මක වෙනස්කම ඇතිකරයි."

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද?

(අ).මනුෂ්‍ය ඝාතනයේ වර්ග කිරීම් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ආ).සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය සහ මිනීමැරීම යන අපරාධ වල සදෝෂී මානසික ධාතුවෙහි විවිධ අංග එකිනෙකට සම-විසම වන අයුරු දක්වන්න.

(ලකුණු 15)

4. ඩැනී යනු නගරය තුළ හා නගරයෙන් පිටත ඇති රෙදි පිළිවෙළඳසැල් ගණනාවක හිමිකරුවකු වන ධනවත් ව්‍යාපාරිකයෙකි. නගරය තුළ වෙළඳසැලෙහි මෙන්ම නගරයෙන් පිටත අලෙවි මධ්‍යස්ථානවල විශාල සේවක සංඛ්‍යාවක් ඔහු සේවයේ යොදවා ඇත. ඔහුගේ පුතා නගරයේ ප්‍රසිද්ධ පාසලක ඉගෙනුම ලබන වයස අවුරුදු දහතුනක පිරිමි දරුවෙකි. ඔහු සාමාන්‍යයෙන් පොදු ප්‍රවාහන සේවය භාවිතා කරමින් පාසලට යයි.

එක් දිනක් ඩැනීට දුරකථන ඇමතුමක් ලැබුණු අතර ඇමතුම්කරු විසින් ඔහුට තර්ජනය කරමින් කියා සිටියේ රුපියල් මිලියනයක් ලබා නොදුනහොත් ඔහුගේ පුතා පාසලේ සිට නිවසට පැමිණෙන විට පැහැර ගන්නා බවයි.තවද පොලිසියට නොපවසන බවට ඇමතුම්කරු විසින් තරයේ විධාන කළ අතර එසේ කළහොත් පුතාගේ ජීවිතය අනතුරේ බවට ද ප්‍රකාශකළේය.

පුතාගේ ආරක්ෂාව ගැන සලකා බලමින් ඩැනී විසින් සිය සේවක මණ්ඩලයේ විශ්වාසවන්ත සේවකයෙකු වන ලාල් මඟින් ඇමතූ පුද්ගලයා වෙත රුපියල් මිලියනයක මුදල ලබාදීමට නිහඬව සැලසුම් කළේය.ඇමතුම්කරු දැනුවත් කළ පරිදි නොහඳුනන ඇමතුම්කරුගේ නියෝජිතයකු වෙත එම මුදල් සහිත බෑගය ලාල් භාර දුන්නේය.නොහඳුනන ඇමතුම්කරුගේ නියෝජිතයා එම ප්‍රදේශයේ සිටින රනා නමැති ප්‍රසිද්ධ මැරයෙකු බවට ලාල් හඳුනාගත්තේය.

ඉහත අවස්ථාවන්හිදී නොහඳුනන ඇමතුම්කරු හා ඔහුගේ නියෝජිතයා යම් වරදක් සිදුකර තිබේද යන්න ඩැනී ඔබගෙන් විමසා සිටී.

ඔහුට උපදෙස් දෙන්න.

ඔබගේ පිළිතුර අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීරණ මගින් පහදන්න.

(ලකුණු 20)

5.පහත දැක්වෙන සිද්ධීන් සලකා බලන්න;

(අ).පියල් යනු සුනිල්ට හිමි රෙදි පිළි වෙළඳ සැලක ගබඩාකරුවෙකි. සුනිල් සති දෙකක නිවාඩුවක් සඳහා විදෙස්ගත විය. ඔහු නොමැති කාලය තුළ රෙදි පිළි වල ආරක්ෂාව හා ගණුදෙනු සම්බන්ධ වගකීම පියල්ට පවරා දෙන ලදී. ඔහුට තවදුරටත් උපදෙස් දුන්නේ සුනිල් විසින් දැනටමත් රෙදි පිළි භාර දී ඇති ගැනුම්කරුවන්ගෙන් මුදල් ලබාගන්නා ලෙසටයි.ඔහු නැවත පැමිණීමේදී පියල් හා නිමල් අතර ඇති ගිවිසුමෙහි වගන්ති උල්ලංඝනය කරමින් පියල් විසින් ගැනුම්කරුවන්ගෙන් ලබාගත් මුදල් ප්‍රමාණයක් තම ගිණුමට බැර කරගෙන ඇති බවට සුනිල් අනාවරණය කරගත්තේය.

(ලකුණු 10)

(ආ)සුරේෂ් යනු ශ්‍රී ලංකාවේ කීර්තිමත් නීති විද්‍යාලයක අවසන් වසර සිසුවෙකි. ඔහු පාසලට ඇවිද එමින් සිටියදී රුපියල් පනස් දහසක් සහිත මුදල් පසුම්බියක් සොයා ගත්තේය.මුදල් පසුම්බිය අහුලාගෙන ඔහුගේ මිතුරන් පිරිසක් සමඟ අසල ඇති අවන්හලකට ගිය අතර රුපියල් විසි පන් දහසක් දවල් ආහාරය සඳහා වියදම් කළේය.ඔහු පාරේදී සොයාගත් මුදල් වියදම් කිරීම පිළිබඳව ඔහුගේ එක් මිතුරෙකු ප්‍රශ්න කළ විට ඔහුගේ තර්කය වූයේ ඔහු කිසිවෙකුගේ මුදල් පසුම්බිය සොරකම් නොකළ නිසා ඔහු විසින් කිසිදු වරදක් සිදු කර නොමැති බවයි.

ඔබගේ පිළිතුර අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීරණ මගින් පහදන්න.

(ලකුණු 10)

6. "මංකොල්ලකෑම යනු සොරකම සහ බලෙන් ලබා ගැනීම යන වරද ද්විත්වයම අන්තර්ගත වන සංයුක්ත වරදකි."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

7.එක් දිනක වයස අවුරුදු පහළොවක් වන නිල්මිණී උපකාරක පන්තියේ සිට නිවසට පැමිණෙමින් සිටියාය. අතරමඟදී, වසර දෙකකට වඩා වැඩි කාලයක් ඇය සමඟ ප්‍රේම සම්බන්ධතාවයක් පවතින අවුරුදු 20 ක් වයසැති සුරේන් නැමැති තරුණයා ඇයට මුණගැසුණි.ඔහු ඇයට සන්ධ්‍යා ආහාර වේලක් ලබා ගැනීමට භෝජනාගාරයකට යාම සඳහා ආරාධනා කළ අතර ඇය එයට එකඟ වූවාය. ඇය ආහාර ලැයිස්තුව බලමින් සිටින අතරතුරදී සුරේන් ඇයට පළතුරු යුෂ වීදුරුවක් ලබා දුන්නේ ය . ඇය විසින් ඒ පිළිබඳ විමසූ විට සුරේන් ප්‍රකාශ කළේ එය අසල තිබෙන පළතුරු යුෂ වෙළඳ සැලකින් මිලදී ගත් බවත් එය විශේෂයෙන්ම ඇය කැමති රසයට ගැලපෙන පරිදි සාදා ඇති බවත්ය.

පලතුරු යුෂ පානය පානය කිරීමෙන් පසුව නිල්මිණී මද මත් තත්වයට පත් වූවාය. ඇය සමඟ රාත්‍රී ආහාරය ලබා ගැනීමෙන් පසු සුරේන් ඇයව අසල ඇති හෝටලයක් වෙත රැගෙන ගියේ ඇයට කෙටි විවේකයක් අවශ්‍ය බව පවසමිනි. නිල්මිණී සුරේන් සමග හෝටලයට යාමට එකඟ වූවාය හෝටලය තුළදී සුරේන් නිල්මිණීව සෙමින් ස්පර්ශ කිරීමට පටන්ගත් අතර නිල්මිණී එයට කිසිදු විරුද්ධත්වයක් නොපෙන්නුවාය.මඳ වේලාවකින් පසු සුරේන් ඇය සමඟ ලිංගික සංසර්ගයක නිරත විය.

නිවසට පැමිණීමෙන් පසුව ඇය හෝටලය තුළ සිදුවූ සියල්ල මවට හෙළිකල අතර,ඇය කෙටි නින්දක සිටින විට හෝටලය තුළ සිදුවූ කිසිවක් පිළිබඳ නොදන්නා බවට ඇය ප්‍රකාශ කළාය.කෙසේ නමුත් ඇයව පවුලේ වෛද්‍යවරයා විසින් පරීක්ශා කර, ඔහු විසින් නිල්මිණීගේ මවට දැනුම් දෙන ලද්දේ ඇය දූෂණයට ලක්ව ඇති බවයි.

සුරේන්ට එරෙහිව පොලිසියට කරන ලද පැමිණිල්ලට සුරේන්ගේ තර්කය වන්නේ හෝටලය තුළ සිදුවූ සියල්ලටම නිල්මිණී කැමැත්ත ලබා දුන් බවයි.

1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනත මඟින් හඳුන්වා දෙන ලද නව ස්ත්‍රී දූෂණ නීතිය ඇසුරින් ඉහත සඳහන් සිද්ධිමය කරුණු සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

8.පහත සඳහන් මාතෘකා අතුරින් <u>ඕනෑම දෙකක්</u>(02) පිළිබඳව සටහන් ලියන්න.

(අ).ළදරුභාවය

(ආ).අවශ්‍යතාවය

(ඇ).අහඹුව

(ඈ). දණ්ඩ නීති සංග්‍රහයේ 294 වගන්තිය යටතේ ඇති ලිහිල් කිරීමේ ආයාචනා.

(ලකුණු 10x 2= 20)

****සියළුම හිමිකම් ඇවිරිණි****